| සුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | ZEOM<br>කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட<br>Zonal Education Office - Minuwangoda |
|---|---|

**වාරය - II**

| ශ්‍රේණිය : 8 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 7 - විධි ක්‍රියා - ආශිර්වාද ක්‍රියා |
|---|---|---|

- **විධි ක්‍රියා :**

යම් අණ කිරීමක් හෝ නියෝගයක් මෙන්ම ආයාචනයක් හෝ ඉල්ලීමක් කිරීම සඳහා භාවිතාවන ක්‍රියාපද විධි ක්‍රියා වේ.

උදාහරණ :

- අණකිරිම / නියෝග
  කියනු/කියව/කියමු
- ඉල්ලීම /ආයාචනය
  කියන්න/ කියනුමැන

- **01.පහත දැක්වෙන ක්‍රියා පද අණකිරීම් විධි ක්‍රියා පද හා ඉල්ලීම් විධි ක්‍රියා පද ලෙස වර්ග කර දක්වන්න.**
  - කපනු ,කරන්න,බලව,කරව,සලකවු, දෙනු මැන, එන්න, ලියන්න, බලනු, කියවු, කරනු මැන

| අණකිරීම්/ නියෝග | ඉල්ලීම්/ආයාචනාය |
|---|---|
| | |

- **සිංහල භාෂාවේ විධි ක්‍රියා නිර්මාණය වන ආකාර කිහිපයකි.**

01.ක්‍රියා මූලය ම විධි ක්‍රියා අර්ථය දෙයි.
උදා: බල ,අස, සැල

02.ක්‍රියා මූලයට පසුව ‘ව‘ හා ‘වු‘ ප්‍රත්‍ය එක්කිරීමෙන් විධි ක්‍රියා සෑදෙයි. ‘ව‘ ඒකවචන හා ‘වු‘ බහුවචන වේ.
උදා: අසව,කරව,යවු,සලකවු

03.‘නු‘ ප්‍රත්‍යයෙන් අවසන්වන ක්‍රියා රූප විධි ක්‍රියා ලෙස යෙදේ.මෙය ඒක වචන බහුවචන දෙකෙහි ම යෙදේ.
උදා, කපනු, සිතනු, හිඳිනු

04.ක්‍රියා මූලයට _න්න, _න්ට, _න්ඩ ප්‍රත්‍යය එක්වීමෙන් විධි ක්‍රියා නිර්මාණය වේ. ඒක වචන බහු වචන දෙකෙහිම යෙදේ.
උදා: කන්න,කන්ට,කන්ඩ

05.'නු' ප්‍රත්‍යයෙන් අවසන්වන ක්‍රියා රූපවලට පසුව මැනවි,හොඳයි ,යෙහෙකි,මනාය වැනි නිපාත පද යෙදීමෙන් විධි ක්‍රියා සෑදේ.මෙමඟින් ආදරාර්ථය ප්‍රකාශ වේ.
උදා:කරනු මැනවි, දෙනු මැනවි,කියනු යෙහෙකි.

06.ක්‍රියා මූලයට 'පිය' සහ 'පියවු' ප්‍රත්‍යය එක් වීමෙන් ද විධි ක්‍රියා නිර්මාණය වේ. 'පිය' ඒක වචන වන අතර 'පියවු' බහු වචන වේ.
උදා : කියාපිය , නටාපියවු

07.ක්‍රියා මූලයට _පන් , _පල්ලා ප්‍රත්‍යය එකතු වීමෙන් ද විධි ක්‍රියා සෑදේ. මෙවැනි පද සිංහල කථා ව්‍යවහාරයේ දක්නට ලැබේ.
උදා:බලාපන් , බලාපල්ලා

- **02.පහත දැක්වෙන විධි ක්‍රියා පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.**

01.කපනු ..........................................................................................................
02.කරනු මැනවි ..........................................................................................................
03.බල ..........................................................................................................
04.කන්න ..........................................................................................................
05.සිතනු ..........................................................................................................

**03.පහත සඳහන් පාඨවල ඇති විධි ක්‍රියා පද සොයා ලියන්න.**

01."පුතා මෙහෙ එන්න .අද ගොඩක් වැඩ තියෙනවා"

..........................................................................................................

02."ඒයි , පූර්ණකය මෙහෙට වර මෙහෙට වර......... "

..........................................................................................................

03."පලයන් යන්න .........,පොඩ්ඩක් පත්තරේවත් බලන්න නැහැ"

..........................................................................................................

04.තමන්ගේ තරම දැනගෙන කල් හරිනු

..........................................................................................................

05."ගම්පහ බහින අය ඉස්සරහට එන්ඩ"

..........................................................................................................

06."..................... නුඹලා තිදෙන මගියන් විය නොහැකිය .ඇත්ත කියනු යෙහෙකි."

..........................................................................................................

- **ආශිර්වාද ක්‍රියා :**

යමෙකුට සුබ හෝ අසුබ පැතුමක් කිරීමේ දී භාවිතාවන ක්‍රියා විශේෂය ආශිර්වාද ක්‍රියා ලෙස හඳුන්වයි.

- ආශිර්වාද ක්‍රියා අනතීත කාලයෙහි, පුරුෂ තුනෙහි,ඒක වචන හා බහු වචනයෙහි වර නැගේ.

 උදා:

 01.සුබ පැතුම් අර්ථයෙහි යෙදෙන ආශිර්වාද ක්‍රියා

 සුබ නව වසරක් වේවා !

 02.අසුබ පැතුම් අර්ථයෙහි යෙදෙන ආශිර්වාද ක්‍රියා

 සතුරෝ වැනසෙත්වා!

- ආශිර්වාද ක්‍රියා උත්තම ,මධ්‍යම ,ප්‍රථම පුරුෂ තුනේ වර නැගෙන්නේ මෙසේය.

| පුරුෂය | ඒක වචන | බහු වචනයෙහි |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ජයවේවා ! | ජයවෙත්වා! |
| මධ්‍යම පුරුෂ | ජයවෙහිවා! | ජයවෙහුවා! |
| උත්තම පුරුෂ | ජයවෙම්වා! | ජයවෙමුවා! |

- සමහර අවස්ථාවල දී විධි ක්‍රියා රූප ද ආශිර්වාදාර්ථයෙන් යෙදේ.

 උදා: තබන තබන පය ලිස්සා වැටීයන්

- තවත් අවස්ථාවක දී 'වා' ප්‍රත්‍යය නොමැතිව ක්‍රියා මූලය ම ආශිර්වාද ක්‍රියා ලෙස යෙදේ.

 උදා: සැරද මහරජ දින දින

- ශුභ ප්‍රාර්ථනයක දී මෙන් ම අශුභ ප්‍රාර්ථනයක දී ද මෙම ක්‍රියා පද යෙදෙන නිසා ඒවා ප්‍රාර්ථනා ක්‍රියා ලෙස ද හඳුන්වයි.

- **01.පහත සඳහන් ආශිර්වාද ක්‍රියා පද පුරුෂ තුනෙහි වර නගන්න.**

 I. සැරදේවා!

 II. වැනසේවා!

 III. දිනේවා!

- **02.සුදුසු ආශිර්වාද ක්‍රියා පද යොදා හිස්තැන් පුරවන්න.**

I. ඔබට සුබ උපන්දිනයක් ............................(වේවා/වෙත්වා)

II. මම නිදුක් ................................................(වෙම්වා/වෙමුවා)

III. නුඹලා නීරෝගී .......................................(වෙත්වා/වෙහුවා)

IV. සතුරා ...........................................(වැනසේවා/වැනසෙත්වා)

| විධි ක්‍රියා | ආශිර්වාද ක්‍රියා |
|---|---|
| | |

V. අපි විභාගයෙන් ජය .................................(ලබමුවා/ලබම්වා)

- **03.පහත දැක්වෙන පද විධි ක්‍රියා සහ ආශිර්වාද ක්‍රියා වශයෙන් තෝරා වගුව තුළ සටහන් කරන්න.**

(පනිනු,මැවියන්,හරිනු,හිඳුව,පෑදේවා,දෙනු මැනවි,සලකවු,ඉවසව,මියදෙත්වා,බලාපල්ලා,සැනසෙහුවා,කන්න, සුවපත්වෙත්වා)